# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2244/9 - 2021 සැප්තැම්බර් මස 07 වැනි අඟහරුවාදා - 2021.09.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: 6/3/7/22
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/9/2014/PC/342

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතේ සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර* :-

මෙහි මහජන කටයුත්ත යනු මප/මා/නා/මේල්පිටිය මහා විද්‍යාලය පවත්වාගෙන යාම සඳහා ඉඩම් අත්කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වගපනහ උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ මේල්පිටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2021.03.05 දින සම්මත කරන ලද අවසාන ගම් පිඹුරු අංකය 264, අතිරේක අංක 14, පත්‍ර 12 දරන සැලසුමේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කොටස:

01. **කැබැලි අංක 1189**
ඉඩමේ නම: ගල්බොඩවත්තේ හේන; විස්තරය: ක්‍රීඩා පිටිය; හිමිකම් කියන අය: මාතලේ මේල්පිටිය පදිංචි දිසානායක මුදියන්සේලාගේ කොලොන්ගොල්ලේ ගෙදර ටිකිරි බණ්ඩා (මියගොස්) සහ මාතලේ, මේල්පිටිය පදිංචි දිසානායක මුදියන්සේලාගේ කොලොන්ගොල්ලේ ගෙදර හීන් බණ්ඩා විසින් හිමිකම් කියයි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2430

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2021 ඔක්තෝබර් මස 04 වැනි දින, පෙ. ව. 9.00ට නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2021 සැප්තැම්බර් මස 27 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

චින්තක ඉලංගසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2021 අගෝස්තු මස 17 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*